# 1

# ආසියානු ප්‍රදේශය



# ආර්ථික ක්‍රියාකාරකම්

ආසියානු ප්‍රදේශයේ **කෘෂිකාර්මික**, **කාර්මික** හා **සේවා** යන ආර්ථික ක්‍රියාකාරකම් වල විවිධත්වයක් දක්නට ලැබේ.

- කෘෂිකාර්මික -පාකිස්ථානය
- කාර්මික- ජපානය
- සේවා- ඩුබායි

# කෘෂිකාර්මික රටක් ලෙස පාකිස්ථානය

- කෘෂිකර්මය පාකිස්ථාන ආර්ථිකයේ ප්‍රධාන අංශය වේ
- එහි ප්‍රමුඛ ස්වාභාවික සම්පත් වන්නේ **වගා කළ හැකි භූමිය** සහ **ජලය** යි
- පාකිස්ථානයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 25.9%ක් කෘෂිකාර්මික අංශයෙනි
- පාකිස්ථානයේ ශ්‍රම බලකායෙන් 43%ක් කෘෂිකර්මයෙහි යෙදෙති
- රටෙහි මුළු භූමියෙන් 25%ක් පමණ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතයට ගෙන ඇත

දළ දේශීය නිෂ්පාදිතයෙන් 25.9%ක් කෘෂි අංශයෙන්ද
24%ක් කාර්මික අංශයෙන් ද
53.3%ක් සේවා අංශයෙන් ද සැපයේ.

- අමු කපු (Raw cotton) සපයන ලෝකයේ ප්‍රමුඛ රටක් ලෙස පාකිස්ථානය වැදගත් වේ.
- ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන ලෙස

තිරිඟු, සහල්, උක්, අඹ, කපු, චික් පී, එළවලු, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදිත, ගව මස්, එළු මස් හා බිත්තර ප්‍රධාන වෙයි.

එහි ප්‍රමුඛතම කෘෂිකාර්මික ප්‍රාන්තය වන්නේ තිරිඟු සහ කපු බහුල ව වගා කෙරෙන පංජාබය යි.
සින්ධ් සහ පංජාබ් ප්‍රාන්තවල අඹ වගාබිම් ව්‍යාප්ත ව ඇති අතර, පාකිස්ථානය ලොව සිවු වන විශාලතම අඹ නිෂ්පාදකයා ය.

- පාකිස්ථානය ලෝකයේ විශාලතම වාරිමාර්ග පද්ධති සහිත රටක් ලෙස ද වැදගත් ය.
- ඉන්දු ගංගා නිම්න වාරි පද්ධතිය මගින් එරට හෙක්ටයාර් මිලියන 16ක පමණ කෘෂි බිම් ප්‍රමාණයකට ජලය සැපයේ.





මේ සියලු කෘෂිකාර්මික නිෂ්පාදන දේශීය හා විදේශීය වෙළෙඳපොළ
අරමුණු කර නිෂ්පාදනය කිරීම විශේෂ ලක්ෂණයකි.

පාකිස්ථානයේ ප්‍රධාන කෘෂිකාර්මික වගා කන්න හෙවත් වගා සෘතු දෙකකි.

1. කාරිෆ් (Khariff)

2. රාබි (Rabi)

| වගා කන්නය | බල පැවැත්වෙන කාල සීමාව | වගා කරන බෝග |
|---|---|---|
| කාරිෆ් | අප්‍රේල් සිට ඔක්තෝම්බර් ඔක්තෝබර් දක්වා | කාපු, වී ,මිල්ට් ,මේස් සහ උක් |
| රාබි | නොවැම්බර් සිට මාර්තු දක්වා | තිරිඟු ,බාර්ලි ,ඕට්ස් |

# කාර්මික රටක් ලෙස ජපානය

- ජපානය ආසියාවේ මෙන් ම ලෝකයේ ප්‍රධාන කාර්මික රටකි.
- ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය අනුව **ලෝකයේ ආර්ථික බලවතුන්** වීමට ජපානයේ කාර්මික අංශය බෙහෙවින් දායක වී ඇත.
- ජපානයේ දළ ජාතික නිෂ්පාදිතයෙන් 27.5%ක් කර්මාන්ත අංශය විසින් හිමි කර ගනී.
- එරට ශ්‍රම බලකායෙන් 26.2%ක් නිරත වන්නේ කාර්මික අංශයේ රැකියාවන්හි ය.

දළ දේශීය නිෂ්පාදිතය 26.2%ක් කාර්මික අංශයෙන් ද
3.9%ක් කෘෂි අංශයෙන් ද
69.8%ක් සේවා අංශයෙන් ද දායක වේ.

- සම්පූර්ණයෙන් ම **අමුද්‍රව්‍ය** සහ **ඛනිජ තෙල් ආනයනය** මත කර්මාන්ත පවත්වාගෙන යයි.

- එරට නිෂ්පාදන කර්මාන්ත
  - මෝටර් රථ
  - විදුලි උපකරණ
  - යන්ත්‍රෝපකරණ
  - යකඩ සහ වානේ
  - ගුවන්යානා හා නැව්
  - රසායන ද්‍රව්‍ය
  - පෙට්‍රෝ රසායන
  - අර්ධ සන්නායක
  - රෙදිපිළි
  - පරිගණක හා පරිගණක උපාංග
  - දෘශ්‍යමය විද්‍යුත් උපකරණ උපාංග
  - ජෛව රසායන නිෂ්පාදනය
  - රොබෝ තාක්ෂණය
  - ඖෂධ සහ සැකසූ ආහාර





- ජපානය ලෝක මෝටර් රථ නිෂ්පාදනයෙන් 6 වන ස්ථානය හිමි කර ගෙන ඇත.

- නිෂ්පාදනවල උසස් ප්‍රමිතිය, කල්පැවැත්ම, සුබෝපභෝගී බව සහ අති නවීන උපාංගවලින් සමන්විත වීම හා ඉන්ධන කාර්යක්ෂමතාව හේතු වේ



- මෝටර් රථ නිෂ්පාදන සමාගම්
    - ටොයෝටා
    - මිට්ෂුබිසි
    - නිසාන්
    - හොණ්ඩා
    - සුසුකි
    - ඉසුසු
    - මැස්ඩා
    - සුබාරු
    - ඩයිහට්සු
    - හීනො

- ප්‍රධාන **මෝටර් සයිකල්** නිෂ්පාදන සමාගම්
  - හොණ්ඩා
  - යමහා
  - සුසුකි
  - කවසාකි

- **ඉලෙක්ට්‍රොනික් හා විදුලි උපකරණ** නිෂ්පාදන සමාගම්
  - සෝනි
  - මිට්සුබිෂි
  - ඉලෙක්ට්‍රික්
  - කැෂියෝ
  - පැනසොනික්
  - හිටාචි
  - කැනන්
  - ෆුජිට්සු
  - නිකොන්
  - යමහා
  - ෂාප්
  - නෙක්

- **පෙට්‍රෝ රසායන** කර්මාන්ත
  - ප්ලාස්ටික්
  - පොලියෙස්ටර්
  - පොලිප්‍රොප්ලීන්

- **පරිගණක සහ පරිගණක උපාංග** නිෂ්පාදන කර්මාන්ත
  - නෙක්
  - ෆුජිට්සු
  - සීකෝ
  - ඔප්සන්
  - අයි. බී. එම්. ජපැන්

- **ජෛව තාක්ෂණය** යොදා ගන්නා ක්ෂේත්‍ර
  - කෘෂිකර්මය
  - සත්ව පාලනය
  - ඖෂධ නිෂ්පාදනය
  - රසායන ද්‍රව්‍ය කර්මාන්තය
  - ආහාර සැකසීම

- ලෝකයේ **පරමාණුක බලශක්තිය** බහුල ලෙස භාවිත කරන රටවල් අතර ද ජපානය ඉදිරියෙන් සිටී.

- ජපානයේ ප්‍රධාන කාර්මික සංකේන්ද්‍රන ලෙස
  - **ඔසාකා**
  - **ටෝකියෝ**
  - **නගෝයා**
  - **කියෝතෝ උතුරු කියුෂු ප්‍රදේශ** වැදගත් වේ.

# සේවා මධ්‍යස්ථානයක් ලෙස ඩුබායි

- එමිරේට්ස් ලෙස හඳුන්වන රාජ්‍ය හතකින් සමන්විත **එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ** එක් කුඩා එමිරේට් රාජ්‍යයක් ලෙස ඩුබායි හැඳින්විය හැක

- වර්ග කිලෝමීටර් 3885ක් තරම් කුඩා රාජ්‍යයකි
- ජන සංඛ්‍යාව 2,502,715කි
- ජන ඝනත්වය වර්ග කිලෝමීටරයට 644.2කි
- ඉතා ජනාකීර්ණ රටකි
- **ගෝලීය නගරයක්** ලෙස ද හඳුන්වයි

- **මැදපෙරදිග කලාපයේ** **ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානය** වේ

- ඩුබායි ආර්ථිකයේ පදනම වනුයේ **පෙට්‍රෝලියම්** නිෂ්පාදනය යි. එමගින් උපයන අතිවිශාල ධනය එරට වෙනත් ක්ෂේත්‍රවල ආයෝජනය කර ඇත

**ඩුබායිහි භෞතික පරිසරය කෘෂිකාර්මික කටයුතු සඳහා යෝග්‍ය නොවන බැවින් එය සේවා මධ්‍යස්ථානයක් ලෙස දියුණු කර ඇත.**

- ඩුබායි ආර්ථිකයෙහි ප්‍රධාන අංශ අතර වැඩි ම ප්‍රතිශත වටිනාකම හිමි කරගන්නේ සේවා අංශය යි.

- එය එරට මුළු දළ දේශීය නිෂ්පාදිතයෙන් 37.2%ක් පමණ වේ.

- එරට රැකියා නියුක්තිකයන්ගෙන් 33.0%ක් පමණ නිරත වන්නේ සේවා අංශයේ රැකියාවල ය.

- මෙම සේවා අංශය නිසා ඩුබායි වේගයෙන් දියුණු වන ආර්ථිකයක් සහිත රටක් බවට පත් වී ඇත.

- සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට සේවා අංශය ප්‍රමුඛ කරගත් ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කර ගෙන ඇත.

# ඩුබායි රට විසින් පවත්වාගෙන යන සේවා කර්මාන්ත

- පෙර-අපර දෙදිග සම්බන්ධ වන ගුවන් ගමන් මධ්‍යස්ථානයක් වීම.
  ඒ අනුව ලෝකයේ බොහෝ ගුවන් ගමන් මාර්ගවල අතරමැද නැවතුම් හා සේවා මධ්‍යස්ථානයක් ලෙස වැදගත් වේ.

- නිදහස් වෙළෙඳ වරායක් මෙන් ම මැදපෙරදිග ප්‍රධාන අපනයන මධ්‍යස්ථානය ලෙස ද එරට ජෙබිල් අලි වරාය (Port Jebil Ali) වැදගත් වීම.

- සංචාරක ආකර්ෂණ හා සංචාරක සේවාවන් රැසක් සපයන ප්‍රධාන සංචාරක කේන්ද්‍රස්ථානයක් වීම.

- ජාත්‍යන්තර සන්නිවේදන සේවා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

- ක්‍රිකට් සහ ටෙනිස් ක්‍රීඩාවේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරග සඳහා ක්‍රීඩාංගණ පහසුකම් සපයන ක්‍රීඩා මධ්‍යස්ථානයක් වීම. (Indoor Stadium & Day & Night Cricket Stadium)

# ඩුබායි රට විසින් පවත්වාගෙන යන සේවා කර්මාන්ත

- "Dubai Mall" නමින් හැඳින්වෙන තොග හා පාරිභෝගික වෙළෙඳම සිදුවන ලෝකයේ විශාලතම වෙළෙඳ මධ්‍යස්ථානය පිහිටුවා තිබීම්

- නිදහස් වෙළෙඳ කලාප පැවතීම.

- අන්තර්ජාල නගරයක් (internet city) පවත්වාගනෙ යමින් සේවා සැපයීම.

- මාධ්‍ය නගරයක් (media city) පවත්වාගෙන යාම.

- දැනුම් ගම්මානයක් (knowledge village) පවත්වාගෙන යාම.

- අධ්‍යාපන හා පුහුණු කේන්ද්‍රයක් (education and training hub) පවත්වාගෙන යාම.

## ක්‍රියාකාරකම්

1. පාකිස්ථානය ආසියාවේ ප්‍රධාන කෘෂිකාර්මික රටක් ලෙස වැදගත් වීමට හේතු හතරක් සඳහන් කරන්න.
2. පාකිස්ථානයේ ප්‍රධාන කෘෂිකාර්මික සෘතු දෙක සඳහන් කර එම එක් එක් සෘතුවේ වගා කෙරෙන බෝග වර්ග මොනවා දැයි ලියා දක්වන්න.
3. පාකිස්ථානයේ ප්‍රධාන කෘෂි අපනයන බෝග වර්ග පහක් නම් කරන්න.
4. ජපානය ආසියාවේ ප්‍රධාන කාර්මික රටක් ලෙස වැදගත් වීමට හේතු හතරක් සඳහන් කරන්න.
5. ජපානයේ ප්‍රධාන කාර්මික නිෂ්පාදන මොනවා දැයි ලියා දක්වන්න.
6. ඩුබායි ආසියාවේ සේවා මධ්‍යස්ථානයක් ලෙස වැදගත් වන්නේ කුමන හේතු නිසා දැයි ලියා දක්වන්න.